ඌව පළාත් සභාවේ දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් / උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2017

ඌව පළාත් සභාවේ දෙමළ මාධ්‍ය පාසල්වල පවතින සඳහන් විෂයන්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා උපාධිධාරීන් / උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කාර්යාලය වසාදින දිනය 2017.02.27 දින වේ.

උපලේඛන අංක 01 - පුරප්පාඩු විෂය ලේඛනය

අ.අ	විෂයය	විෂය කේත අංකය
	01-11 වසර දක්වා පුරප්පාඩු විෂයන්	
1.	ප්‍රාථමික	21
2.	ඉස්ලාම්	22
3.	හින්දු	23
4.	කෘෂි හා ආහාර තාක්ෂණය	24
5.	ගණිතය	25
6.	විද්‍යා	26
7.	විද්‍යාව	27
8.	තොරතුරු තාක්ෂණය	28
9.	ඉතිහාසය	29
	අ.පො.ස. (උ/පෙළ) විෂයන්	
1.	රසායන විද්‍යාව	30
2.	ජෛවික විද්‍යාව	31
3.	ජීව විද්‍යාව	32
4.	සංයුක්ත ගණිතය	33
5.	දේශපාලන විද්‍යාව	34
6	භූගෝල විද්‍යාව	35
7	ගණනාධිකරණය	36
8	ව්‍යාපාර අධ්‍යයනය	37

01. බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :

(අ) අයදුම්කරු / අයදුම්කාරිය පරම්පරාවෙන් කෝ ලිඛිතවලින් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(ආ) යහපත් චරිතයකින් හා මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඇ) ඌව පළාත් ස්ථිර පදිංචිකරුවන්ට සහ ඌව පළාතට යාබද පිට පළාත් වන මධ්‍යම, බස්නාහිර, නැගෙනහිර හා දකුණු පළාත්වල පදිංචිකරුවන්ට ද අයදුම්පත් ඉදිරිපත් කළ හැකි වේ. එක් එක් විෂයයන් සඳහා සුදුසුකම් සහිත ප්‍රමාණවත් අයදුම්කරුවන් ඌව පළාතේ නොමැති වුවහොත් පමණක් පිට පළාත් අයදුම්කරුවන් සම්මන්ත්‍රණයේ සලකා බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ජන්ද හිමි තාක්ෂේත්‍රය කෝ ග්‍රාම නිලධාරි සහතික මගින් ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

සටහන :
ඌව පළාත් සභා සීමාව තුළ අයදුම්පත් භාරදීමේ අවසාන දිනට වසර 03 ක් හෝ ඊට වැඩි ස්ථිර පදිංචියක් ඇති අයකු සමග නීතානුකූලව විවාහ වී ඌව පළාතේ පදිංචියට පැමිණ අයදුම්පත් භාරදින අවසාන දිනට ජන්ද හිමි තත්ව ලේඛනයෙන් ලියාපදිංචිය සනාථ කරන කෙනෙකුට ද අයදුම් කළ හැක. එවැනි අය ලිඛිත සාක්ෂි මගින් මෙම තත්ත්වය තහවුරු කිරීම අනිවාර්ය වේ.

(ඈ) 2017.02.27 වන දිනට වයස අවුරුදු 18 ට නොපැසුව සහ 45 ට නොවැඩි විය යුතුය.

02. අධ්‍යාපන සුදුසුකම් :

2.1 2.1.1 විෂයයන් 03 පට සම්මාන සාමාන්‍ය සහිතව භාෂාව / සාහිත්‍ය හා ඇස්ත ගණිතය / ගණිතය විෂයන් ද ඇතුළුව, විෂයන් 06 කින් අපොස. (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් විය යුතුය.

2.1.2 අපොස (උ/පෙළ) තුව විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවම වශයෙන් විෂයයන් තුනකින් එකවර සමත් වීම

හෝ

අපොස. (උ/පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සහිතව (අවම වශයෙන් විෂයන් 03 කින්) එකවර සමත් විය යුතුය.

සටහන : විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය අපොස. (සා/පෙළ) හා අපොස. (උ/පෙළ) විභාග හා සමානව පිළිගනු ලබන විභාග සමතුන්ටද අයදුම් කළ හැක.

2.2 ඉහත 2.1 වී සුදුසුකම් සමග එක් එක් විෂයට අදාළව පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

අ.අ.	විෂය	අධ්‍යාපන සුදුසුකම
01 - 11 වසර විෂයන්ට අදාළ සුදුසුකම් :		
1.	ප්‍රාථමික	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් පිරිනමනු ලබන සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.
2.	ඉස්ලාම්, හින්දු, ඉතිහාසය	විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමෙන ආයතනයකින් අයදුම්කරු ලබන විෂයට අදාළව විශේෂ උපාධියක් ලබා තිබීම.
3.	විද්‍ය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් දැනට කලා උපාධියක් හෝ විද්‍ය විෂය ප්‍රධාන විෂයක් ලෙස හදාරා උපාධියක් ලබා තිබීම සහ අ.පො.ස. (උ/පෙළ) සඳහා අදාළ විෂය හදාරා සමත් වී තිබීම. ** සටහන බලන්න
4.	කෘෂි හා ආහාර තාක්ෂණය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් කෘෂි විද්‍යාවේදී විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
5.	ගණිතය / විද්‍යාව	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් ගණිත විද්‍යා / වෛද්‍යය විද්‍යා විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
6.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / පරිගණක විද්‍යාව පිළිබඳ විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
අ.පො.ස. (උ/පෙළ) විෂයන්ට අදාළ සුදුසුකම් :		
1.	රසායන විද්‍යාව, ජෛවික විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් අයදුම් කරනු ලබන විෂයට අදාළව විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.
2.	ගණනාධිකරණය, ව්‍යාපාර අධ්‍යයනය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමෙන ආයතනයකින් අයදුම් කරනු ලබන විෂයට අදාළව විශේෂ හෝ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම හෝ උසස් තාක්ෂණ ආයතනයෙන් පිරිනමන පිළි අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව ලබා තිබීම.

** සටහන : දැනට තලා විශේෂ උපාධිධාරීන් තරග විභාගයේ එක් එක් විෂයට අදාළ සාධනීය මට්ටම (40%) ලබා ගෙන ඇත්නම් එම අයට ප්‍රමුඛතාවය ලබා දෙන අතර, එම උපාධිධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු ඉතිරිව පවතින්නේ නම් පමණක් තරග විභාගයේ එක් එක් විෂයට අදාළ සාධනීය මට්ටම (40%) ලබා ගෙන ඇති අනෙකුත් උපාධිධාරීන් කුසලතාවයේ අනුපිළිවෙලින් පුරප්පාඩු සම්පූර්ණ වන තෙක් සලකා බලනු ලැබේ.

2.3 එක් එක් විෂයට අදාළව ඉහත 2.1 හා 2.2 වී දක්වා ඇති සුදුසුකම් 2017.02.27 දිනට හෝ ඊට පෙර වලංගු පරිදි සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවා කොන්දේසි :

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) මුලින් පත් කරන තානාපල් වසර 03 ක් අත්හිටුවීමයෙන්ම සේවය කළ යුතු අතර, කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් හෝ අනුකූලත්ව කිරීම සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ඇ) වසර 03 ක සේවා කාලයකට පසු ඌව පළාත් ගුරු මාර්ග ප්‍රතිපත්තිය අනුව සේවා අවශ්‍යතාවය මත ඌව පළාතේ වෙනත් පාසලකට ස්ථාන මාරුවීම් ලබාදීමේ ඌව පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සලකා බලනු ඇත.

(ඈ) පිට පළාත් අයදුම්කරුවන් වසර 03 ක කාලයක් ඌව පළාත සඳ අත්හිටුවීමයෙන්ම සේවය කළ යුතුය.

(ඉ) රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ දැක් ශ්‍රී ලංකා ගුරු සේවා වාර්තාව සංයුක්තයේ පනවා ඇති කොන්දේසිවලට ද එම වාර්තාවට තර ඇති කෝ මින් මතුවට කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

(ඊ) උපාධිධාරීන් ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (අ) ශ්‍රේණියටද, ඩිප්ලෝමාධාරීන් ඌව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියටද බඳවා තනු ලැබේ.

(උ) 2016.02.25 දිනැති රාජව. අංක 03/2016 හි GE-1-2016 වැටුප් මණ්ඩල යටතේ මාසිකව රු. 27,740/-300X6 - 380X7 - 445X2 - 33,090/- මාසික වැටුප් පරිමාණය අනුව උපාධිධාරීන් 14 වන වැටුප් පියවර වන රු. 32,200/- ක මාසික වැටුප් පියවරේදී පිළිවුලක් ලබන අතර, එම වැලලෙන්වේ උපලේඛන අංක II අනුව වැටුප් මෙවනු ලැබේ.

04. බඳවා ගැනීමේ ක්‍රමය :

4.1 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා වාර්තාව සංයුක්තයේ 7.2.3.2 සහ 7.2.3.4 හි සඳහන් විධිවිධාන අනුව පාසල් පාදක ක්‍රමය අනුව බඳවා ගැනීම සිදුකරනු ලැබේ.

4.2 ඌව පළාතේ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙන අතර, ඔවුන් වෙත පත්වීම් ලබා දීමෙන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු ඉතිරිව පවතින්නේ නම් පමණක් පිට පළාත් අයදුම්කරුවන් සම්මන්ත්‍රණයේ සලකා බලනු ලැබේ.

4.3 තියමිත සුදුසුකම් සහිත විධිමත් අයදුම්පත් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වුවහොත් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට සහ ඉංග්‍රීසි භාෂාවට ඔබත කැමති කෙනා විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට හා ඉංග්‍රීසි භාෂාවට ඔබත කැමති කෙනා පදනම් කරගත් ප්‍රායෝගික පරීක්ෂණයකට සාරාංශ කර ලිඛිත තරග විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.4 තියමිත සුදුසුකම් සහිත අයදුම්පත් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වුවහොත් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත්වන්නු ලබන ලිඛිත තරග විභාගයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට හා ඉංග්‍රීසි භාෂාවට ඔබත කැමති කෙනා පදනම් කරගත් ප්‍රායෝගික පරීක්ෂණයකට සාරාංශ කර ලිඛිත තරග විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුස්සන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.5 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :
ශ්‍රී ලංකා ගුරු සේවා වෘත්තීයවාර සභා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා සිටුවදුර පරීක්ෂා කිරීම සහ තාක්ෂ හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

4.6 ප්‍රායෝගික පරීක්ෂණය :
ගුරු වෘත්තීයවේදී වැදගත් වන ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බලේ. ශ්‍රී ලංකා ගුරු සේවා වෘත්තීය සංයුක්තයේ සඳහන් තීරණයක පදනම මතොලෙකින මේ සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

4.7 එමෙන්ම මෙම ගැසට් නිවේදනයේ අවධානය යොමුවන යම් කරුණක් වෙනත් එම අවස්ථා ගුරු සේවා වෘත්තීය සංයුක්තයේ සඳහන් විධිවිධානවලට යටත් වනු ඇත.

05. අයදුම් කළ යුතු පිළිවෙළ :

5.1 මෙම නිවේදනයේ අතර යොදා ඇති ආදර්ශ අයදුම්පතය අනුව ඊ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පතය සකස් කරගත යුතුය. අයදුම්පතයේ ඒ ඒ තීරුවෙන් ලබා දී ඇති උපදෙස් අනුමතයය කරමින් පහතදීලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. අංක 01 සිට 07 දක්වා කොටස් පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද අනුකූල වන සේ අයදුම්පතය සැකසිය යුතුය.

5.2 සම්පූර්ණ කරන ලද අයදුම්පත 2017.02.27 දින හෝ ඊට පූර්ව ලැබෙන සේ **"ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිලිමතලාවෙ පාර, බිංගලාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්පත් බාහිරට පිටුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ **"ඌව පළාත් සභාවේ දෙමළ මාධ්‍ය පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් / උසස් ජාතික ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම - 2017"** යනුවෙන් සහ මම අයදුම් කරන විෂය හා විෂය අංකය සැකැදිලිව සටහන් කළ යුතුය.

5.3 අයදුම්කරුවෙකුට එක් විෂයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම් කරනු ලබන විෂය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ. උපලේඛන අංක 01 අනුව අයදුම් කරනු ලබන විෂය හා විෂය කේත අංකය, අයදුම්පතේ අකුරු ස්ථානයක සැකැදිලිව සඳහන් කළ යුතුය.

5.4 එක් අවස්ථාවකදීයක් ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පතෙහි තම මාතෘකාවේ අනුපිළිවෙළ අනුව උපලේඛන අංක 02 හි සඳහන් පුරප්පාඩු පාසල් අතරින් ඉල්ලුම් කරන විෂයට අදාළ පුරප්පාඩු පවතින පාසල් 03 ක් හා පාසලට අදාළ අනුක්‍රමික අංකය අයදුම්පතේ අදාළ ස්ථානයේ සැකැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම් කරන පාසල් හා එහි අනුපිළිවෙළ පසුව වෙනස් කරනු නොලැබේ. සේවා අවශ්‍යතාවය මත ඉල්ලුම් කරන ලද පාසලකට තුර වෙනත් පාසලකට පත්කළ හැකි අතර, පාසල් තමා කිරීම ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදුකරනු ලැබේ.

5.5 තියමිත ආදර්ශ අයදුම්පතයට අනුකූල නොවන, විභාග හා පරිපාලන ගාස්තු සෝධා නොගැති අයදුම්පත්, පුමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් සහ තියමිත සුදුසුකම් නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පතය ප්‍රවේශපත්‍ර නිවේදනයේ දැක්වෙන ආකාරේ පමණට අනුකූලව ඉදිරිපත් කිරීම අවේක්ෂණයන්ගේ වගකීමකි. අයදුම්පත් තැපෑලේදී හැකිවිය හා පුමාද වීම පිළිබඳ කෙරෙන කිසිදු පැහැදිලිකරන සලකා බලනු නොලැබේ. ඉදිරිපත් කරන අයදුම්පතයේ රාජ්‍ය පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

5.6 අත්සන සහතික කිරීම .
අයදුම්පතයේ අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු / කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු / පාමාදන විනිශ්චයකාරවරයෙකු / විදුලුම් කොමසාරිස්වරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ශ්‍රීමාන මහදැවැප් අධිකාරී බලදලයේ නිලධාරියෙකු / පොලිස් සේවයේ අසවර කළ නිලධාරීයෙකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක දරන රු. 240,360/- ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන ස්ථිර මාණ්ඩලීය ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලබ තිබිය යුතුය.

06. විභාග හා පරිපාලන ගාස්තු :

විභාග ගාස්තු හා පරිපාලන ගාස්තු රු. 600/- කි. **ඌව පළාතේ අයදුම්කරුවන් අදාළ විභාග ගාස්තු ඌව පළාතේ ප්‍රධාන ලේකම්ගේ නාමයෙන් තීරක 20.03.20.13** ධ ඔබර වන පරිදි ඌව පළාත තුළ පිහිටා ඇති කිසිම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක මුදලින් හෝ වෙනත් ඒ සඳහා කිසිත් කරන කුවිතාන්සියි අයදුම්පතයට ඇමුණා එවිය යුතුය.

අයදුම්කරු ඉදිරිපත් කරන පිට පළාත් අයදුම්කරුවකට පමණක් අදාළ විභාග ගාස්තු දිවයිනේ පිහිටි කිසිම බැංකුවකට "ඌව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ මිලුම් අංක 269-1-001-4-8440477 ධ ඔබර කර ලබා ගත්තා ලදුපත අයදුම්පතයට අමුණා එවිය යුතුය.

ලදුපත මුද්‍රිතයක අයදුම්පතයට අමුණා එවිම අනිවාර්ය වන අතර, ඉදිරි ප්‍රයෝජනය සඳහා එකී ආයා පිටපතක් ලග තබා ගැනීම යෝජනා වේ. ඉහත සඳහන් ආයතනවලට තුර වෙනත් ආයතනවලට මුදල් හෝ ලබා ගත් ලදුපත් හෝ මුදල් අණුමුම් හෝ මුද්දර හෝ භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු ආපසු හෙවනු නොලැබේ.

07. විභාග පරිපාටිය හා තරග විභාගයේ විෂය නිර්දේශය :

7.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් හට පහතින පරීක්ෂා කිරීමකින් තොරව තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර කිසුත් කරනු ඇත. විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අවස්ථානයෙන් වේ නම් දන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව මෙම කොමිෂන් සභාවේ වික්ෂය යුතුය. එසේ වික්ෂිමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, රාජකීය හැඳුනුම්පත් අංකය හා ලිපිනය මිස්වැරදි සඳහන් කළ යුතුය. තමා ලග තබා ගත් අයදුම්පතයේ රාජ්‍ය පිටපත, විභාග ගාස්තු කෙටු ලදුපතෙහි පිටපත හා අයදුම්පතය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සියේ පිටපත ද ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 තරග විභාගය බැලුල්ල සහ මොනරාගල තරගවලදී පැවැත්වෙනු ඇත. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් බලුල්ල තරගවලදී පමණක් විභාගය පැවැත්වෙනු ඇත.

7.3 තියමිත විභාග ක්‍රමවේදී විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්මන්ත්‍රණයෙන් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නිර්දේශවලට විභාග අවස්ථානයන් යටත් වේ. එම නිර්දේශ උල්ලංඝනය කලහොත් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවම්කට යටත් වීමට බලා හෝ ඇතැ සිදුවනු ඇත.

7.4 විභාග දිනයේදී අවේක්ෂකයාගේ අත්තනාමය සහතිකිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දොස්තකමින්තුවෙන් කිසුත් කල වලංගු රාජකීය හැඳුනුම්පත හෝ වලංගු වීසාවක් ගෙන් ඇල්පතය විභාග කාලවේලේ වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ලියවිලි තැර වෙනත් කිසිදු ලියවිල්ලක් පිළිගනු නොලැබේ.

7.5 තරග විභාගයට පිටිමට ප්‍රවේශ පත්‍රය කිසුත් කිරීම අයදුම්කරු අදාළ කාලතුරා සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයදුම්කරු පත්වීම ලබා දීම සඳහා මුදුසුස්සෙකු ලෙස සලකනු ලැබේ.

7.6. මෙම තරග විභාගය සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අවේක්ෂකයෙකු මුල් විභාගය සඳහාම පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් අයදුම්කර් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

7.7. ලිඛිත තරග විභාගය බලාපොරොත්තු හා පෙනී පිළිතුරුවලින් සමන්විත පහත ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ. සෑම අවේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) සඳහාම පෙනී සිටිය යුතුය.

- **අභිගෝහනතාව - කාලය පැය 01 - ලකුණු 100**
  අවේක්ෂකයා සතු ගුරු වෘත්තීය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොටගෙන මෙම ප්‍රශ්නපත්‍රය සකසනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය.
- **සාමාන්‍ය දැනීම - කාලය පැය 01 - ලකුණු 100**
  ගුරු සේවකයකට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදුවී ඇති සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳව සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

තරග විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ලබාගත යුතුය.

7.8 ප්‍රායෝගික පරීක්ෂණය : **කාලය - විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ. - උපරිම ලකුණු 25**
අයදුම්කරු විසින් නඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් සිදු යුතුය. මෙම සඳහා පහත පරිදි ලකුණු කිසි වේ. මෙම පරීක්ෂණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

අනු අංකය	ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන තීරණයක	තීරණයකයන්ගේ අරමුණ	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
01.	අරමුණ හා ඉලක්ක වීම	පාඨමාලා පාඨමාලේ අරමුණ පැහැදිලි කිරීම හා පාඨමාලා ප්‍රධාන්ය වීමේ හැකියාව ඇගයීම	05	02
02.	පොරවය හා ගද පාලනය	ගුරුවරයෙකු ලෙස මිනා පොරවයකින් යුතුවීම හා ඉගැන්වීමේදී මිනා ලෙස ගද පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම	05	02
03.	සන්නිවේදනයේ පැහැදිලි බව	ඉගෙනුම / ඉගැන්වීම ක්‍රියාවලියේදී අදාළ කරුණු රැලදැයි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම	05	02
04.	පාඩම සැලසුම්කරණය	ලබා දෙනු ලබන පාඩමිණ්ඩ තුළ අරමුණ කෙරෙහි ලක්ෂ්‍ය වීමේ කුසලතාව ඇගයීම	05	02
05.	ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය	අරමුණ කෙරෙහි ලක්ෂ්‍ය වීම සඳහා ඉදිරිපත් කිරීමේ විදුත් ක්‍රම මිනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම	05	02
	මුළු ලකුණු ප්‍රමාණය		25	10

* ප්‍රායෝගික පරීක්ෂණය සමන්වීම සඳහා එක් එක් තීරණයක සඳහා අවම වශයෙන් ලකුණු 2 ඔබින් ලබා ගත යුතුය.

08. සම්මුඛ පරීක්ෂණ සඳහා තියමිත දිනයේදී සහතික කොටස අයදුම්කරුවන් විසින්දිය කිසිදු අපදාවක් තැබන සලකා බලනු නොලැබේ.

09. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් තර ගනු නොලැබේ.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අවේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඔහුම අවස්ථාවකදී හෙලන් / ඇයගේ අවස්ථානයේදීය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද අවේක්ෂකයකු ඉදිරිපත් කළ යම් තොරතුරක් සාවද්‍ය බව හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඔහුගමින් යටතේ තර ඇති බව හෝ අනාවරණය වුවහොත් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

11. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සිදු කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොටසක් සම්පූර්ණ කිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව කෙමි මම සම්මන්ත්‍රණයේ වන කුමන හෝ කරුණක් පිළිබඳව අවසාන තීරණය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොගැති කිසියම් කරුණක් වෙනොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ උපදෙස් මත ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදුකරනු ඇත.

(ආර්.එම්.ටී.බී. හාතියල්දෙණිය)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2017.02.02 වන දින,
ඌව පළාත්